**ඉතාලිය තුල සහ මෙම ධූත මණ්ඩලයට යටත් සයිප්‍රසය, ග්‍රීසිය, මෝල්ටා රාජ්‍ය සහ යුරෝපීය සංගමයේ වෙනත් රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයන් වෙත කෙරෙන නිවේදනයයි.**

**<u>තහනම් කරන ලද ''Murraya Leaves / කරපිංචා'' ශ්‍රී ලංකාවේ සිට ඉතාලිය, සයිප්‍රසය, ග්‍රීසිය සහ මෝල්ටා රාජ්‍යයට ගෙන ඒම සම්බන්ධවයි.</u>**

යුරෝපා සංගමයේ EUROPHYT දැනුම් දීම අනුව ඉහත ආහාර අයිතමය ශ්‍රී ලංකාවේ සිට යුරෝපා සංගමයේ රටවල් වලට රැගෙන ඒම තහනම් කොට ඇත. එහෙත් පසුගිය නොවැම්බර් මාසයේ සිට ඉතාලියට පැමිණි ශ්‍රී ලාංකිකයන් විශාල ප්‍රමාණයක් ඔවුන්ගේ ගමන්මලු තුළ කරපිංචා රැගෙන පැමිණ ඇති බවත් එයින් වැඩි ප්‍රමාණයක් කටානියා ගුවන් තොටුපළේ දී අනාවරණය කර ගන්නා ලද බවත් ඉතාලියේ සහ යුරෝපා රේගු ආයතන දැනුම් දී ඇත. යුරෝපා සංගමය යටතේ තහනම් කරන ලද ආහාර ද්‍රව්‍ය එම සංගමයට අයත් රටවලට මෙසේ රැගෙන ඒම ශ්‍රී ලංකාවේ සිට ඉතාලියට සහ යුරෝපා රටවලට අපනයනය කරනු ලබන වෙනත් ආහාර ද්‍රව්‍ය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරයි.

එම නිසා, ''**<u>කරපිංචා</u>**'' ආහාර අයිතමය ඔබගේ ගමන්මලු තුළ රැගෙන ඒම සිදු නොකරන ලෙස කාරුණිකව දන්වා සිටින අතර එවැනි ද්‍රව්‍ය රැගෙන ඒමෙන් කටුනායක ගුවන් තොටුපළේ සිදු කරන ගමන් මලු පරීක්ෂාවේ දී විවිධ අපහසුතා වලට මුහුණ දීමට ඔබට සිදුවිය හැකි බව ද තව දුරටත් දන්වා සිටිමු.

මේ පිළිබඳ ඔබගේ කාරුණික අවධානයට ස්තූතිවන්ත වන අතර, මෙම වැදගත් තොරතුරු ශ්‍රී ලංකාවේ සිට පැමිණෙන ඔබගේ ඥාතීන් හා මිතුරන් වෙතද ලබා දෙන්නේ නම් කෘතඥ වෙමු.

ස්තූතියි !

**ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, රෝමය**
**24.12.2018**